අපේ අතීතය ගැන කියවමු - 7

# ධාතුසේන රජතුමා

කියා දෙන්නේ
කමලා සිල්වා

ISBN - 978-955-696-004-4

සියලු හිමිකම් ඇවිරිණි.
© සුමිත ප්‍රකාශකයෝ
ප්‍රථම මුද්‍රණය, 2012

(c) Sumitha Publishers

ප්‍රකාශනය
**සුමිත ප්‍රකාශකයෝ**
www.sumithabooks.com
e-mail : info@sumithabooks.com

බෙදාහැරීම:
**සී/ස සරසවි පොත්හල**
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්,
506, හයිලෙවල් පාර, නාවින්න - මහරගම.
දුරකථනය : 2804773



මහසෙන් රජුගේ මරණයෙන් පසු, සිරි මේඝවර්ණ, බුද්ධදාස, උපතිස්ස සහ මහානාම යන රජවරු පුරාණ ශ්‍රී ලංකාවේ රජ කළහ.

ක්‍රි.ව. 410 සිට ක්‍රි.ව. 432 දක්වා රජ කළ මහානාම රජුගේ රාජ්‍ය කාලය තුළ දී, දකුණු ඉන්දියාවෙන් පැමිණි පාණ්ඩ්‍ය නායකයෝ හය දෙනෙක් ලංකාවේ උතුරු පෙදෙසෙහි පිහිටියා වූ රජරට ආක්‍රමණය කළහ. ඔව්හු සිංහල රජතුමා සිහසුනෙන් නෙරපා දැමූහ. මේ නිසා සිංහල රාජ්‍ය නායකයෝ දකුණෙහි පිහිටි රුහුණු රටට පළා ගියහ.

(c) Sumitha Publishers

ක්‍රි.ව. 433 සිට ක්‍රි.ව. 459 දක්වා වූ අවුරුදු විසි හය තුළ ඔව්හු රුහුණේ සිට පාලනය ගෙන ගියහ.




(c) Sumitha Publishers



මහානාම රජුගේ දියණිය වූ
සංඝා කුමරියට ධාතුසේන නම්
පුත් කුමරෙක් විය. පාණ්ඩ්‍ය පාලකයෝ
ධාතුසේන කුමරු සොයමින් සිටියහ.
මේ නිසා ධාතුසේන කුමරුගේ මාමා කෙනෙකු වූ
මහානාම නමින් ම යුත් භික්ෂුවක විසින්
ඔහු හදා වඩා ගන්නා ලදී.

මහානාම භික්ෂුව කුමරුගේ ආරක්ෂාව සඳහා
ඔහු මහණ කරවීය.
එලෙස වෙස් මාරු කර ඔහු
ආරක්ෂා කළේය.

(c) Sumitha Publishers


(c) Sumitha Publishers



තරුණ වියට පැමිණි භික්ෂුව,
පාණ්ඩ්‍ය රජවරු එළවා දමා නැවත රජරට
දිනා ගැනීමට මහත් ඕනෑකමකින් සිටියේය.

මේ නිසා ඔහු සිවුරු හැර දමා
හමුදාවක් සකසා ගැනීම ආරම්භ කළේය.
මේ හමුදාව සමඟ ඔහු අනුරාධපුරයට ගමන් කර,
අවසාන පාණ්ඩ්‍ය රජ වූ තිරිතර පරාජය කළේය.

(c) Sumitha Publishers